# <u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම</u>

**<u>2023.07.14</u>**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සම සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023.07.14 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් විසින් පිලිගන්නා ලද අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අරමුණ පැහැදිලි කරමින් අද දින රැස්වීමේ දී විවිධ ක්ෂේත්‍ර යටතේ සාකච්ඡා කිරීමට බොහෝ කරුණු ඇති බව පෙන්වා දෙමින් ගරු සම සභාපතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදි.

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | **පසුගිය රැස්වීමෙන් පැනනැගුණු කරුනු පිලිබඳව සාකච්ඡා කිරීම** | | | |
| 1.1 | තරුණ සේවා සභාව සතු ඉඩකඩම් හා ගොඩනැගිලි භාවිතය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීම | ගොවිපලේ කටයුතු සඳහා විධිමත් සැලැස්මක් සකස් කර ඇතත් පවතින සේවක පුරප්පාඩු හේතුවෙන් එම කටයුතු පසුබෑමකට ලක්වී ඇති බව දන්වන ලද අතර, තාක්ෂණික උපදෙස් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. ග්‍රාම සේවක වසම් වල තරුණ සමිති පිහිටුවීමට අදාලව තරුණයන්ගේ සහභාගීත්වය වැඩි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ලබා දෙන ලෙස ද ඉල්ලීම් ඉදිරිපත් විය. | ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුලු අනෙකුත් නිලධාරීන් තාක්ෂණික උපදෙස් සහ අවශ්‍ය වන අනෙකුත් සහාය ලබා දෙන ලෙස දන්වන ලද අතර, භූමිය ඵලදායී අයුරින් යොදා ගනිමින් කෘෂි නිෂ්පාදනයක් සිදුකිරීම සම්බන්ධයෙන් වැඩි අවධානය යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සියලුම ප්‍රාදේශිය ලේකම්වරු / අධ්‍යක්ෂ - කෘෂිකර්ම/ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්/ සහකාර අධ්‍යක්ෂ - තරුණ සේවා සභාව |
| 1.2 | හෙද විද්‍යාලය සඳහා නේවාසික පහසුකම් ලබා ගැනීම | හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලේ පවතින සම්පත් භාවිතා කරමින් නේවාසිකාගාර අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා පැරණි රෝහල් පරිශ්‍රයේ පවතින හෙද නේවාසිකාගාරය සුලු අලුත්වැඩියා කටයුතුවලින් පසුව හෙද විදුහලට තාවකාලිකව ලබා දීම, දේශන සඳහා පැරණි රෝහල් පරිශ්‍රයේ ශ්‍රවනාගාරය සහ අනෙකුත් පහසුකම් තාවකාලිකව ලබා දීම සඳහා එකඟතාවයකට පැමිණ ඇති බව වාර්තා විය. එමෙන්ම රෝහල ආසන්නයෙන් හෙද විදුහලක් ඉදිකිරීම වඩාත් සුදුසු බවට ද කරුණු ඉදිරිපත් විය. | එම එකඟතා අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | රෝහල් අධ්‍යක්ෂ- හම්බන්තොට |
| 1.3 | වනඅලින්ට ගමන් කළ නොහැකි වන පරිදි අධිවේගී මාර්ගයේ ඇති කල්වට් සඳහා එල්ලෙන විදුලි | වන අලින්ට ගමන් කල නොහැකි වන පරිදි කල්වට් හරහා එල්ලෙන විදුලි වැට සකස් කිරීමට අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ එකඟතාව අවශ්‍ය බව පෙන්වා දුනි. ඒ අනුව නිසි ක්‍රමවේදයට අනුව එල්ලෙන විදුලි වැට සකස් කළ | දෙපාර්ශවය සාකච්ඡා කර අදාල කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ ජනරාල් - අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය / සහකාර අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | වැට සවි කිරීම | යුතු බැවින් ඊට එකඟවන්නේ නම් අවස්ථාව ලබා දිය හැකි බව දන්වන ලදි. | | (වනජීවී දකුණ) |
| 1.4 | සුහුරු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අදාල ආයතනවලට පවරා දීම | ව්‍යාපෘතියේ කටයුතු සිදුකරමින් පවතින බවත් මේ වන විට ව්‍යාපෘති 41ක වැඩ අවසන් කර ඇති බවත් දන්වන ලද අතර එම ව්‍යාපෘති අදාල ආයතනවලට පවරාදීමේ කටයුතු සිදුකරමින් පවතින බවද දන්වන ලදි. | අවසන් කරන ලද ව්‍යාපෘති අදාල ආයතනවලට නිසි පරිදි පවරා දීම කඩිනමින් සිදුකරන ලෙස උපදෙස් ලබාදුනි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - සුහුරු ව්‍යාපෘතිය/ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 1.5 | හම්බන්තොට මහ රෝහල පිහිටි ඉඩම රෝහල වෙත පවරා දීම | ඊට අදාල ලිපි ලේඛන කටයුතු අවසන් කර ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. | ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු- මහවැලි අධිකාරිය / රෝහල් අධ්‍යක්ෂ - හම්බන්තොට මහ රෝහල |
| 1.6 | වලස්මුල්ල මූලික රෝහලේ අභ්‍යන්තර මාර්ග පද්ධතියේ ඉතිරි වැඩ නිම නොකිරීම හේතුවෙන් මතු වී ඇති ගැටලු | ඇස්තමේන්තුවක් සකස් කර දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. | ආණ්ඩුකාරතුමන් විසින් එකගතාවය ලබා දී ඇති බැවින් එම කටයුතු කඩිනම් කරගන්නා ලෙස දන්වන ලදි. | ලේකම් - දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය/ වෛද්‍ය අධිකාරී - වලස්මුල්ල මූලික රෝහල |
| **02** | **ජාතික මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 2.1 | ඒකාබද්ධ ජලධාරා හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ **(IWWRMP)** වර්තමාන තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම | මේ වන විට ව්‍යාපෘති වාර්තා ඉදිරිපත්කර ඇති බවත්, ආරම්භ කර ඇති ව්‍යාපෘතිවල කටයුතු සිදුකරමින් බවතින බවත් දන්වන ලදි. | මේ සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග අධ්‍යක්ෂ / නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලි අධිකාරිය / පළාත් වාරිමාර්ග ඉංජිනේරු |
| 2.2 | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහනේ ප්‍රවේශය (**CResMPA)** වර්තමාන තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම | | | |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **03** | **දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 3.1 | දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය සම්බන්ධ ගැටලු හා ප්‍රගතිය ඉදිරිපත් කිරීම | තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන නියමු ව්‍යාපෘතිය යටතේ ගම්මාන 07ක වැඩ ආරම්භ කර ඇති බවත් ඒ සඳහා ප්‍රතිලාභීන් 1002ක් වෙනුවෙන් රු..මි. 164ක් අනුමත වී ඇති බවත්, ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ අන්නාසි වගාව, ඇපල් පේර වගාව හා දෙළුම් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් තුනක් සඳහා රු..මි. 23 ක පමණ ප්‍රතිපාදන අනුමත වී ඇති අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 175ක් බවත්, උඳු/මුං බෝග වගාව හා එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘති දෙකක් සඳහා රු..මි. 28ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1032ක් බවත් දන්වන ලදි. | එම ව්‍යාපාති නිසි අධීක්ෂණය හා පසු විපරම් කිරීම සිදු කළ යුතු බවට උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ - කෘෂිකර්ම/ නියෝජ්‍ය අධ්‍යක්ෂ - සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 3.2 | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීම | වලස්මුල්ල, ඩෙංගු රෝගීන් වැඩි වීමට හේතු සොයා බැලීමේ දී වලස්මුල්ල ප්‍රදේශයේ ටයර් කඩයක් හේතු වී ඇති බවට තොරතුරු වාර්තා වූ බව දන්වන ලදි. කටුවන ප්‍රදේශයෙන් වාර්තා වූ රෝගීන්ද වලස්මුල්ල ටයර් කඩය ආශ්‍රිතව රැකියා කරන අය බවද දන්වන ලදි.<br>වරායන් ආශ්‍රිතව ගොඩගැසෙන කසළ ගොඩවල් ද ඩෙංගු මදුරුවන් බෝවීම වැඩිවීමට හේතු වී ඇති බව දන්වන ලදි.<br>සැම සිකුරාදා දිනකම පෙ.ව.9-10 දක්වා පැය රාජ්‍ය ආයතන පිරිසිදු කිරීම සඳහා වෙන් කරන ලෙස උපදෙස් ලබා දෙමින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත් සියලුම රාජ්‍ය ආයතන ඊට අනුව කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.<br>වරායන් ආශ්‍රිතව කසල ඉවත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බවටත්, සතියකට වරක් ධීවරයන් දැනුවත් කිරීම සිදු කරන බවටත්, මේ සම්බන්ධයෙන් ධීවර වරායන් වෙත එල්ලවන චෝදනාවන් අවම කර ගැනීම සඳහා උපරිම උත්සාහයෙන් කටයුතු කරන බවටත් කරුණු ඉදිරිපත් වූ අතර කසල බද්ධ ගෙවන්නේ නම් ෆයිබර් කසල හැර ඇනකුත් කසල නගරසභාව | ඩෙංගු රෝගය බෝවීම වැළැක්වීම සම්බන්ධයෙන් සියලුම දෙනා සහයෝගීව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සියලුම ආයතන ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | මඟින් ඉවත් කිරීමට හැකියාව පවතින බවත් දන්වන ලදි.<br>මී උණ රෝගයෙන් ද දැනට 05 දෙනෙක් පමණ මියගොස් ඇති බවත් අනාරක්ෂිතව මඩට බැසීම නිසා මෙම මරණ සිදු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | ගොවි සංවිධාන හරහා ගොවීන් දැනුවත් කළ යුතු බවටත් තීරණය විය. | |
| 3.3 | අමරවැව තෘණ භූමිය ආශ්‍රිත ප්‍රදේශවල මැණික් පතල් හැරීම නිසා සිදුවී ඇති පරිසර හානි | අමර වැව තෘණ භූමිය තුළ පතල් හැරීම හේතුවෙන් ගැටලු මතු වී ඇති බවටත්, තෘණ භූමියක් වුව ද මේ වන විට වනාන්තරයක් බවට වර්ධනය වෙමින් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. එහෙත් මෙම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බවත් මැණික් හැරීම තුළින් යම් ආදායමක් උපයා ගන්නා බවත් කොටස් වශයෙන් හෝ<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉඩම නිදහස් කර දෙන්නේ නම් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ඊට මැදිහත් විය හැකි බව ද දන්වන ලදි.<br>මෙම කොටස තෘණ භූමියට වෙන් කර ඇති බැවින් නිදහස් කළ නොහැකි බවත්, දැනට බැහැර කර ඇති භූමිවලත් මැණික් ඇති බැවින් එම භූමිවල පතල් හැරීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් සමග අදාල පාර්ශව නිරීක්ෂණ චාරිකාවකින් පසු සාකච්ඡා කර තීරණය ගැනීම සුදුසු බවට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාම ය/<br>දිසාවන නිලධාරී/<br>සහකාර අධ්‍යක්ෂ - මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය |
| 3.4 | වැලි සේදීමේ දී ඉවත දමන අපද්‍රව්‍ය කොටස් නිසා ඇල මාර්ග අවහිර වීමේ ගැටලුව | කරගස්ආර බස්නාව ආසන්නයේ වැලි සේදීමේ කටයුතු නිසි ක්‍රමවේදයකට සිදු නොකිරීම හේතුවෙන් බැහැර කරන ද්‍රව්‍ය ඇලමාර්ගවල සිරවීමෙන් කෘෂිකාර්මික කටයුතුවලට බාධා එල්ල වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>තව ද වලව වත්ත ප්‍රදේශයේ වැලි හැරීමෙන් පසු නැවත පිලිසකර කර නොමැති නිසා විශාල වලවල් සෑදී ඇති බවත්, ගොඩකර කුඹුරු සෑදීම සම්බන්ධයෙන් සොයා බලන බවත්, නීති විරෝධී වැලි කැපීම් නැවැත්වීම සඳහා ආරක්ෂක අංශ සහායෙන් කටයුතු කරන බවත් දන්වන ලදි. | බලපත්‍ර ලබාගෙන නිසි ක්‍රමවේදයකට අනුව කටයුතු නොකරන අයගේ බලපත්‍ර නැවත ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, බලපත්‍ර ලබා දීමේ දී රැඳවුම් මුදලක් තබා ගැනීමෙන් නැවත එම ස්ථාන පිරවීමට එම මුදල් ලබාගන්නා ලෙසත් උපදෙස් ලබා දුන් අතර, නව බලපත්‍ර ලබා දීමේ දී අදාල සියලුම ආයතන සම්බන්ධීකරණය වී කටයුතු කල යුතු බවත් අවශ්‍ය අවස්ථාවල දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගන්නා ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්-අම්බලන්තොට / වාරිමාර්ග ඉංජිනේරු - අම්බලන්තොට / අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය / සහකාර අධ්‍යක්ෂ- භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යංශය හා අනෙකුත් අදාල ආයතන ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **04** | **දිස්ත්‍රික්කයේ ආර්ථික, සමාජීය සංවර්ධනයට අදාලව ආයතන මඟින් යොමු කර ඇති යෝජනා** | | | |
| 4.1 | හම්බන්තොට ලාෆ් ගෑස් කර්මාන්ත ශාලාව හේතුවෙන් ප්‍රදේශවාසීන්ට සිදු වී ඇති ගැටලු | ප්‍රදේශවාසීන්ගේ පැමිණිල්ල අනුව ස්ථානීය පරීක්ෂාවක් සිදුකළද ගෑස් කාන්දුවක් සම්බන්ධයෙන් කිසිදු අනාවරණයක් සිදු නොවූ බවත්, මේ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ආයතනයක වාර්තාවක් ලබාදෙන ලෙස ගෑස් කර්මාන්තශාලාවේ කළමනාකරුවන් දැනුවත් කළ බවත් දන්වන ලදි.<br>ගෑස් කාන්දුවක් හඳුනාගැනීම සඳහා පරිශ්‍රය පුරා Ditector සවිකර ඇති බවත්, ගෑස්වලට එකතු කරන රසායනික ද්‍රව්‍යයක් හේතුවෙන් එම ගඳ වහනය ඇති බවත් එය ශරීරයට අහිතරක නොවන බවත්, අදාල ප්‍රදේශය හා ප්‍රදේශවාසීන් සඳහා රක්ෂණ ආවරණයක් ඇති බවත් දන්වන ලදි. එසේ වුවද, මේ සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට හා කර්මාන්තශාලාව නරඹා අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දීමට කටයුතු කරන බවත්, එක් කරන රසායනිකයේ ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කරන බවත් ගෑස් ආයතනයේ කළමනාකරු විසින් දන්වන ලදි. | කර්මාන්තශාලාවේ ක්‍රියාකාරීත්වය හා එක් කරන රසායනික ද්‍රව්‍යන් පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම කඩිනම් කරන ලෙසත්, අදාල රසායනිකය අව ප්‍රමාණයකින් භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත් මෙමගින් සෞඛ්‍යයට හානි සිදු වන්නේ දැයි සොයා බලන ලෙසත් උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/ ප්‍රාදේශිය ලේකම් - හම්බන්තොට / සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය / සහකාර අධ්‍යක්ෂ - ආපදා කළමාකරණ / කළමනාකරු - ලාෆ් ගෑස් සමාගම |
| 4.2 | වීරවිල තල් සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩම නිරවුල් කිරීම සම්බන්ධ ප්‍රගතිය ඉදිරිපත් කිරීම | ඉඩම නිරවුල් කර නොතිබීම හේතුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉඩම් විකිනීමේ දී තල් සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩම් ද විකුණා ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් එළිපෙහෙළි කර වෙන්කර ගන්නා ලෙසත්, තල් සංවර්ධන මණ්ඩලයට අයත් කොටස වෙන්කර දෙන ලෙසත් උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව / ප්‍රාදේශිය කළමනාකරු - තල් සංවර්ධන මණ්ඩලය/ මිනින්දෝරු අධිකාරී |
| 4.3 | අලි මිනිස් ගැටුම වැළැක්වීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර | පසුගිය ආසන්නම කාලයේ අලි පහරදීම් හේතුවෙන් පුද්ගලයින් 04 දෙනෙකු ජීවිතක්ෂයට පත් වී ඇති බවත්, මිනිසුන්ගේ නොසැලකිලිමත් හැසිරීමද ඊට හේතු වී ඇති බවත් පෙන්වාදෙන ලදි.<br>මේ කාලයේ පවතින වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් ජලය හා ආහාර සොයා අලීන් ගම් වදින බව පෙන්වා දෙන ලද | අදාල දැනුවත් කිරීම් කටයුතු ක්‍රමවත්ව සිදු කරන ලෙසත් අලිවැට සක්‍රිය කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | අදාල ප්‍රාදේශීය ලේකම්වරු / දිසාවන නිලධාරී/ නේවාසික ව්‍යාපාර කළමණාකරු - මහවැලි අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අතර ජනතාව දැනුවත් කිරීම හා අලිවැට සක්‍රිය කිරීමට කටයුතු කිරීම සිදුකරමින් පවතින බව දන්වන ලදි.<br><br>වන අලි සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ ගම්මානවලට ආසන්න කුඩා ලඳු කැලෑ කොටස් එලිපෙහෙලි කිරීම හා අලීන් වෙසෙන මහ වනාන්තරවල වැව් ඉදිකිරීම හා පළතුරු වැවීම ආදී සුපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බවත් දන්වන ලදි.<br><br>බූන්දල සීනුක්කුගල වන අලීන් ගමන්කරන මාර්ගවල අනවසර පදිංචිකරවන් සිටින බවත්, වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශ වීමට ප්‍රථම පදිංචි කරුවන් වන බැවින් ඉවත් කිරීම අපහසු වී ඇති බවත් දන්වන ලදි. | <br><br><br><br>සුපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වාර්තාවක් ලබා දෙන ලෙසඋපදෙස් ලබා දුනි.<br><br>වන අලි සංරක්සණ කලාපයට අලි දැමීමට ප්‍රථමයෙන් ජාතික විදුලිවැට පද්ධතිය සම්පූර්ණයෙන් ඉදිකර අවසක් කළයුතු බව ද පෙන්වා දෙන ලදි. අලි ගමන්කරන මාර්ගයේ පදිංචිකරුවන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | <br><br><br><br>දිසාවන නිලධාරී<br><br>සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ/ දිසාවන නිලධාරී/ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි |
| 05 | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් ඉදිරිපත් කරන ගැටලු** | | | |
| 5.1 | Garnet වැලි සහ අනෙකුත් Heavy Minerals නිස්සාරණ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා ගැනීම | දේශීය විදේශීය සංචාරකයින් භාවිතා කරන වැලිගත්ත මුහුදු තීරයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා ස්ථාන හදුනාගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමක් සිදු නොවන බවත්, මුහුදු තීරයේ පරිසර පද්ධතියට හානියක් නොවන ආකාරයට මෙම ව්‍යාපෘතිය සිදුකරන බවත් දන්වන ලදි. | සංචාරක, රක්ෂිත හා පාරිසරික වැදගත්කමක් ඇති ස්ථානවලට හානියක් නොවන පරිදි අදාල ස්ථාන හදුනාගෙන අවශ්‍ය කයුතු සිදුකරන ලෙසත්, එහිදී අදාල ආයතනවල සහාය ලබා ගන්නා ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට, හම්බන්තොට, තිස්සමහාරාමය / සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය |
| 5.2 | කණුමුල්දෙනිය රක්ෂිතයට අයත් වගා කරන ලද ඉඩම් කොටස් බදු ක්‍රමයක් අනුව බීට්ටු වන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ වගා කිරීමට අවසර ලබා ගැනීම | වර්තමාන ආරම්ක අර්බුදය හමුවේ වගාවන් සඳහා සුදුසු ස්ථාන වෙන්කර දීම තුළින් කෘෂි නිෂ්පාදන වැඩි කිරීමේ හැකියාවක් ඇති බවත් මේ සම්බන්ධයෙන් ගොවීන් 61දෙනෙකු පමණ ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත් දන්වන ලදි.<br>අදාල ස්ථාන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉල්ලුම් කරන ස්ථාන ඝන වනාන්තර බවට හදුනාගත් බවත්, එම ඉඩම් වගාවන් සඳහා ලබා දීමේ හැකියාක් නොමැති බවත්, ස්ථිර වගාවන් නොවන | අදාල පාර්ශව සහයෝගයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල / දිසා වන නිලධාරි |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | කෘෂි වගාව සමඟ වනවගාව සිදු කරන්නේ නම් ඒ පිළිබඳව සළකා බැලිය හැකි බව ද දන්වන ලදි. | | |
| 5.3 | උඩමත්තල හේන් ගොවීන්ගේ ගොවිබිම් නැවත ලබා ගැනීම | රක්ෂිතයේ වගාවන් සඳහා වසරකට අවසර දී තිබූ අවසරය අවලංගු වීමෙන් පසු නැවත අලුත් කිරීමක් සිදුකර නොමැති බවත්, අනවසර වගාකරුවකු සඳහා නඩුවක් ක්‍රියාත්මක වන බැවින් එය අවසන් වන තෙක් නැවත අවසරය දීර්ඝ කිරීමට හැකියාවක් නොමැති බවත්, අලුතින් ඉඩම් වෙන් කර දීමක් සිදු කල නොහැකි බවත්, දැනට වගාවන් කරන අය සඳහා ගැටලුවක් ඇති නොවන බවත් දන්වන ලදි. තවද මෙම හේන් වගා කරුවන්ගෙන් රජයට බීජ සපයන ගොවීන් සිටින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>රක්ෂිත වෙන් කර ගැනීම හා වගාවන් සඳහා අවසර දිය හැකි භූමි හඳුනා ගැනීමේ වැඩසටහනක් ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන බැවින් එම හඳුනාගැනීම්වලින් පසුව වෙනත් දිය හැකි භූමි වෙන්කර දීමේ හැකියාව පවතින බවද දන්වන ලදි. | හේන් ගොවිතැන ජනතාවගේ ජීවනෝපායන මාර්ගයක් වන බැවින් ලබා දිය හැකි ඉඩම් අදාල කොන්දේසි පැනවීමකින් පසුව ලබා දීමට කටයුතු කරන ලෙසත්, නඩු පැවරීමේ දී ද ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර කටයුතු කරන ලෙසත් සත්‍ය වශයෙන්ම හේන් වගාවේ නිරත වන ගොවීන් සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්/ දිසා වන නිලධාරී/ සහකාර අධ්‍යකෂ - වනජීවී දකුණ |
| 5.4 | අනාරක්ෂිත පවුල්වල කාන්තාවන් හා දරුවන් තාවකාලිකව රඳවා තැබීමට සුදුසු ආරක්ෂිත නිවසක් ලබා ගැනීම | විවිධ හේතූන් නිසා අනාරක්ෂිත වන දරුවන් සිටින කාන්තාවන් තාවකාලිකව රඳවා තබා ගැනීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති වීම ගැටලුවක් බවට කරුණු ඉදිරිපත් විය.<br>හම්බන්තොට ක්‍රීඩා භූමිය අසලින් ඉඩමක් හඳුනාගෙන ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලබාගෙන ඇති බවත්, අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇති බවත් දන්වන ලදි.<br>සූරියවැව මහවැලි අධිකාරියට අයත් නිල නිවාස අලුත්වැඩියා කිරීමෙන් පසු භාවිතා කළ හැකි බව දන්වන ලදි. | සූරියවැව මහවැලි නිල නිවාස ලබා ගැනීම සඳහා අදාල ආයතන සම්බන්ධීකරණය වී ඉදිරි කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - සූරියවැව / නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලි අධිකාරිය |
| **06** | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා** | | | |
| 6.1 | ආවරණ අනුමැතිය යටතේ ලබා දුන් ඕකෙවෙල ඉදුල ප්‍රජාමූල සංවිධානයේ වාව්ව ප්‍රජාජල යෝජනා ක්‍රමය | ප්‍රජා ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලයට පවරා ගැනීමේ දී එම ජල ව්‍යාපෘතිවල පවතින වත්කම් පවරා ගැනීමට කටයුතු නොකරන බවට කරුණු ඉදිරිපත් වූ අතර ප්‍රජා ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලයට පවරා ගැනීමේ දී ඒ සඳහා දිස්ත්‍රික් | මෙම ජල ව්‍යාපෘතිය ජලසම්පාදන මණ්ඩලයට පවරා ගැනීම සඳහා මෙම කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදි.<br>ජලසම්පාදන මණ්ඩලයට පවරාගත්නා ජල ව්‍යාපෘතිවලට අදාල ජල | ප්‍රාදේශීය කළමනාකරු - ජලසම්පාදන මණ්ඩලය/ ස්ථාන භාර නිලධාරී - ප්‍රජාජල සැපයුම් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | සඳහා අනුමැතිය ලබා ගැනීම | සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය වන බව පෙන්වා දුනි. | ටැංකි ප්‍රයෝජනවත්ව යොදා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | දෙපාර්තමේන්තුව |
| **07** | **පසුව ලැබුණු ලිපි** | | | |
| 7.1 | මැදකන්ද දොලේ දෙනිය ඇලට බෝක්කුවක් ඉදිකිරීම | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් මුදල් වෙන්කර ගැනීමට ඇස්තමේන්තු සකස් කර ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කරන ලෙස උපදෙස් දුනි. | ප්‍රාදේශීය ලේකම් - කටුවන/ සහකාර අධ්‍යක්ෂ - ආපදා |
| 7.2 | පල්ලෙමලල වී ගබඩාව විවෘත කිරීම | මෙම කන්නයේ වී අස්වනු නෙළීමෙන් පසු ඒවා ගබඩා කර ගැනීමේ දී ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් ගැටලු මතු විය හැකි බැවින් පල්ලෙමලල වී ගබඩාව විවෘත කිරීමේ කටයුතු කඩනම් කිරීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය. | මේ සඳහා වී අලෙවි මණ්ඩලය දැනුවත් කිරීමට තීරණය විය. | අධ්‍යක්ෂ - කෘෂිකර්ම/ ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |
| 7.3 | වැකඳවල ප්‍රජා මූල ජල යෝජනා ක්‍රමය සඳහා ජලය ලබා ගන්නා ඇලට මුරුතවෙල ජලාශයෙන් ජලය ලබා ගැනීම | මෙම ජල යෝජනා ක්‍රමය සඳහා ජලය ලබා ගන්නා මුරුතවෙල ව්‍යාපාරයට අයත් යාය 2 ඩී 9 ඇල මාර්ගයට ජලය ලබා දීම 2023.07.15 දිනෙන් අවසන් බව බවට දන්වා ඇති බවත්, මෙම ප්‍රජා මූල සංවිධානය හරහා පවුල් 600කට ආසන්න ප්‍රමාණයක් පානීය ජලය ලබාගන්නා බැවින් එය ගැටලුකාරී තත්ත්වයක් ඇති කරන බවත් දන්වන ලදි.<br>මෙම ඇල මාර්ගය ජල කාන්දුවීමක් මඟින් ඉදිකර තිබූ බැවින් මේ වන විට එම කාන්දුව පිළිසකර කර තිබීම නිසා ඇල මාර්ගයට ජලය නොලැබෙන බවට කරුණු ඉදිරිපත් විය. තව ද එම ජලය බීමට සුදුසු මට්ටමේ නොමැති බව ද දන්වන ලදි. | අදාල ප්‍රදේශය ආවරණය වන පරිදි ජලසම්පාදන මණ්ඩලයෙන් ජලය ලබා දීමේ හැකියා සම්බන්ධයෙන් සොයා බලන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය / ප්‍රාදේශීය කළමනාකරු - ජලසම්පාදන මණ්ඩලය |

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථක පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පල කිරීමෙන් අනතුරුව ප.ව. 12.00ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

**එච්.පී. සුමණසේකර**
**දිස්ත්‍රික් ලේකම්/ දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය**

එච්. පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

**2023 ජූලි මස** 19 **දින**
**හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දීය.**